# හිනා මනා

සිරිපාල හා ජයපාල කැලයක් මැදින් ගමනක් යන විට ඈතින් පදුරක් හෙලවෙනවා දුටුවහ.

සිරිපාල : බුදු අම්මෝ ! කොටියෙක්
ජයපාල : බය වෙන්න එපා, මගේ ලග තුවක්කුව තියෙනවා.
සිරිපාල : නෑ නෑ කොටියෙක් නෙවෙයි වලහෙක්, අර අර
ජයපාල : මොකද මේ දාඩියත් දාල, බයවෙන්න එපා, මම වලස් සාස්තරෙත් දන්නව.
සිරිපාල : ඒ මොකෙක්වත් නෙවෙයි,අලියෙක් අර හොඩවැල.හැබැයි ඒවට බය වෙන්න ඕන නැහැ මං ඔක්කොම අලි මන්තර දන්නව.
ජයපාල : ඒ එකෙක්වත් නෙවෙයි අර ගෑණියෙක්නෙ.
සිරිපාල : මොනව! ගෑණියෙක්, එහෙනං ඉක්මනට දුවමු,දුවමු.

---

## දේසේ හැටියට බාසේ

පිටිසර බඳ පාසලකට පැමිණි පාඨශාලා පරීක්ෂක එම විදුහලේ මුල් ගුරු තැන ඔහුට සංග්‍රහ නොකිරීම ගැන අප්‍රසාදයෙන් සිටියේය. මුල් ගුරුවරයාගේ වරදක් සොයා ගනිමියි සිතා ඔහු මුල් ගුරුවරයාත් කැටුව පස්වන ශ්‍රේණියට ගොස් එහි ළමයෙකුගෙන් ප්‍රශ්ණ කරන්නට විය.

පරීක්ෂක : පුතාගේ නම මොකක් ද?
ළමයා: සුදු බණ්ඩියා
පරීක්ෂක : ඔන්න පුතාගේ තාත්තා පුතාට සත දහයක් දීලා කියනවා කඩේට ගිහිල්ලා සීනි බෝල ගේන්න කියලා. ඉතින් පුතාට කඩෙන් සීනි බෝල දහයක් දෙනවා. ඒකෙන් තුනක් පුතා කනවා. දෙකක් පුතාගේ අතින් නැති වෙනවා. දැන් පුතා ළඟ ඉතිරි කීය ද?

මින් වික්ෂිප්ත වූ ළමයා ගුරුවරයා දෙසත් පරීක්ෂක දෙසත් බලන්නට විය. මුල් ගුරුතුමා වෙත හැරුණු පරීක්ෂක " බලන්න මිස්ටරි ඔයාගේ ළමයින්ගේ දැනුම ඉතාමත් දුර්වලයිනෙ. මට සිද්ධ වෙනවා මේ ගැන ඉහළට රපෝර්තු කරන්න."
එවිට මුල් ගුරුතුමා ළමයා දෙස බලා

මුල් ගුරු : "මෙහෙට වර බොලල දැන් තොගේ මහ එකා තොට සත දහයක් දීලා කියනවා ගිහින් කඩචෝරු අරං වර කියලා. ඉතිං තෝ කඩේට ගිහිල්ලා කඩචෝරු දහයක් ගන්නවා. තුනක් තෝ කොටා බානවා. දෙකක් තොගෙ අතින් මකබෑ වෙනවා. තොගේ අතේ කඩචෝරු කීයක් ඉතුරුද?"

ළමයා : පහයි

ළමයා උස් හඬින් කීවේය. පාඨශාලා පරීක්ෂක සද්ද නොකරම මුල් ගුරු කාමරයට ගියේය.

**ඔබගේ කෙටි රස කතාව අප වෙත එවන්න. මේ තීරයේ එය පළ කරන්නට අප සූදානම්.**

**විද්‍යුත් ලිපිනය:** chithran@sannasa.com.au

## Cartoon By Shanika Somatilake







